කොලොන්නාව නගර සභාව
කොළඹ දිස්ත්‍රික්කය
------------------------------

**1.** මූල්‍ය ප්‍රකාශන
-----------------

**1.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන **2016** මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන **2015** මාර්තු **31** දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 07 දින සභාවේ සභාපතිවරයා වෙත යවා ඇත.

**1.2** තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කොලොන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------

**1.3.1** ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ වටිනාකම රු.**21**,433 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අනතුරුවලට ලක්වූ වාහන අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු.22,944 ක වියදම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබූ අතර ඊට අදාල ලැබිය යුතු රක්ෂණ වන්දි මුදල ද ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී අවසන් තොගය සත්‍යාපනය කර නොතිබූ අතර තොග ලෙජරයේ දැක්වෙන රු.34,755,432 ක් වූ වටිනාකම තොග ශේෂය ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

**(ඈ)** සමාලෝචිත වර්ෂය ආරම්භයේදි ස්ථාවර තැන්පතු වෙනුවෙන් ලැබුනු මුළු පොලි මුදලින් රු.86,250 ක් වූ මුදලක් කපා හැරීම් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් පොලි ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ බැංකු ගිණුමට ලද සෘජු ලැබීම් රු.25,501 ක් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශ වල සටහන් කර නොතිබුණි.

(ඊ) 2014 වර්ෂයේ ගබඩා අත්තිකාරම් යටතේ මිලදී ගෙන ප්‍රවර්තන වර්ෂයේදී ලැබී තිබූ රු.755,000 ක් වටිනා ඖෂධ තොගයක් සමාලෝචිත වර්ෂයේදී ගිණුම් වලට ගෙන නොතිබුණි.

(උ) 2013 වර්ෂයට අදාලව ලැබී තිබූ රු.20,445,648 ක මුද්දර ආදායම, ඉකුත් වර්ෂයේ ආදායමට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ආදායම් ගිණුම රු.20,445,648 කින් වැඩියෙන් දක්වා තිබූ අතර ඉකුත් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ වටිනාකම රු.733,900 ක් වූ ඉන්ධන මිලදී ගැනීම් වෙනුවෙන් රු.780,100 ක ණය හිමි වෙන්කිරීම නිසා වර්ෂයේ ඉන්ධන වියදම හා ණය හිමියෝ රු.46,200 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ දක්වා ඇති රු.17,760,422 ක් වූ තැන්පත් ගිණුමේ ශේෂය තුල 2012 වර්ෂයට අදාල හිමිකම් නොපෑ රු.216,411ක විශ්‍රාම පාරිතෝෂික මුදල දෙවරක් සටහන් වීම නිසා තැන්පත් ගිණුමේ ශේෂය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) 2015 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපූර්ණය කර ගත යුතු සභික දීමනා රු.1,797,000ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු.123,000ක් ලෙස දැක්වීම හේතුවෙන් එදිනට ලැබිය යුතු ශේෂය රු. 1,674,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) 2008 සිට 2013 වර්ෂය දක්වා ඉකුත් වර්ෂ 6 ක හිමිකම් නොපෑ තැන්පතු රු.2,179,691 ක් සමුච්චිත අරමුදලට ගැලපිය යුතු වුවද එය සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.2 අසම්භාව්‍ය බැරකම්

---------------------

**(I)** සමාලෝචිත වර්ෂය තුලදී බාහිර පාර්ශවයන් විසින් සභාවට එරෙහිව පනවා තිබූ නඩු 03ක් හා සභාව විසින් බාහිර පාර්ශවයකට එරෙහිව පනවා තිබූ නඩු 02ක් අධිකරණයේ විභාග වෙමින් පැවතියද, ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයෙහි සටහනක් ලෙස හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

**(II)** කොලොන්නාව මීතොටමුල්ල ප්‍රදේශයෙහි සභාවට අයත් කසළ බැහැර කරන කුණුකන්ද පිරී ඉතිරි යාම නිසා හා කඩා වැටීම නිසා ප්‍රදේශවාසීන්ගේ නිවාස වලට හානි වීම්,පරිසර දූෂණය වීම්,සෞඛ්‍ය ගැටළු හේතුවෙන් ප්‍රදේශවාසීන් විසින් සභාවට එරෙහිව මානව හිමිකම් නඩු 02 ක් පවරා ඇති බැවින් ආර්ථික ප්‍රතිලාභයක් පිටතට ගලා යාම භව්‍ය වන අතර අසම්භාව්‍ය වගකීමේ ස්වභාවය පිළිබඳව ප්‍රවර්තන වර්ෂයේ ගිණුම්වලින් හෙළිදරව් කර නොතිබුණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

ගිණුම් විෂයයන් 10 කට අදාලව ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.169,911,315 ක් වූ අතර, ඊට අදාල උපයෝගී ලේඛණ /වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.119,149,405 ක් විය.

### 1.3.4 නිරවුල් නොකරන ලද ගිණුම්

--------------------------------

වර්ෂ ගණනනාවක සිට පැවත එන එකතුව රු.512,020 ක් වූ ගිණුම් ශේෂ 04 ක් නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2016 ජුනි 30 දිනට ගනුදෙනු වල ගණනය කළ හැකි වටිනාකම රු.1,033,569 ක් වු විගණන විමසුම් 10 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

විගණනයට අවශ්‍යා තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.86,417,222 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වු ආදායම රු.53,261,623 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 25,989,522 ක් විය.

**2.2** බැංකු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මහජන බැංකුව කොලොන්නාව ගිණුම් අංක 194100173792765

වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව බැංකු ගිණුමේ රු.666,509 ක ශේෂයක් දක්වා තිබූ අතර බැංකු ප්‍රකාශන අනුව එම ශේෂය රු.88,436 ක් ලෙස 2010 වර්ෂයේ සිට දිගින් දිගටම පැවත එමින් තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට සකස් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශයේ බැංකු ශේෂයට වර්ෂ ගණනාවක් තිස්සේ ඉදිරියට ගෙන එමින් පැවති උපලබ්ධි නොවූ චෙක්, බැංකු දෝෂ, වශයෙන් එකතුව රු.1,040,054 ක් දක්වා තිබුණි. ඉහත ගැලපීම් සනාථ කිරීම සඳහා කිසිදු සාක්ෂියක් විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය පිළිගත නොහැකි තත්ත්වයක පැවතිනි.

(ආ) <u>මහජන බැංකුව - කොලොන්නාව ජංගම ගිණුම් අංක 194100153792766</u>

1993 වර්ෂයේ සිට පැවත එන රු.15,000 ක මුදල් මාරු කිරීම් හා නිශ්චිතව වර්ෂයක් සොයා ගත නොහැකි උපලබ්ධි නොවූ චෙක්පත් රු.10,104 ක් බැංකු ප්‍රකාශනයේ ශේෂයට එකතු කිරීම් ලෙස දක්වා තිබුණද, එම ශේෂයන් පිළිබඳව කිසිදු තහවුරු කිරීමක් සඳහා ප්‍රමානවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 3 ආදායම් පරිපාලනය

---------------------

### 3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ජනවාරි 01 දිනට හිඟ ශේෂය | බිල් කිරීම | තථ්‍ය අයකර ගැනීම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 35,370,301 | 67,718,253 | 59,231,282 | 43,857,302 |
| බලපත්‍ර ගාස්තු | **3,350** | 355,600 | 316,750 | 42,200 |
| කුලී | 2,029,634 | 4,163,532 | 2,841,399 | 3,351,767 |
| ව්‍යාපාර බදු | 771,691 | 872,600 | 887,550 | 756,741 |

### 3.2 වරිපනම් බදු

--------------

ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත වරිපනම් බදු හිඟය රු.35,370,301 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට හිඟය රු.43,857,302 ක් විය. මේ අනුව රු.8,487,001 කින් එනම් සියයට 24 කින් සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු හිඟය වැඩි වී තිබුණි.

### 3.3 කඩකුලී

---------

සමාලෝචිත වර්ෂය අවසානයට කඩකුලී හිඟය රු.3,351,767 ක් වූ අතර, මෙම හිඟයෙන් සියයට 30 ක් හිඟ නිවාස කුලි විය.මුළු කුලි හිඟය පෙර වර්ෂය හා සාපේක්ෂව සියයට 65 කින් වැඩි වි තිබුණි.

### 3.4 ව්‍යාපාර බදු

-------------

2015 දෙසැම්බර් 31 දිනට රු.756,741 ක් වු හිඟ ව්‍යාපාර බදු ආදායම් ශේෂය, ඉකුත් වර්ෂයට අදාල හිඟ ආදායමක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා බිල් කරන ලද ව්‍යාපාර බදු ආදායම සමාලෝචිත වර්ෂය තුලදී අයකර ගෙන තිබුණි.පෙර වර්ෂ වල සිට පැවති හිඟය එසේම පැවතුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

අ) සභාව සතු වටිනාකම තක්සේරු නොකළ ඉඩම් ප්‍රමාණයේ එකතුව වූ අක්කර 4 රූඩ් 0 පර්චස් 15.05 ක ඉඩම් සඳහා හිමිකම් ඔප්පු විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

ආ) සභාවට අයිති ගත්මිල රු.3,406,365 ක් වූ ඉසුසු **F.R.R.** කම්පැක්ටරය 2014 ජූනි මස සිට එන්ජින් අලුත්වැඩියාවක් සඳහා ධාවනයෙන් ඉවත් කර තිබුණි. මෙම වාහනය නොපමාව අලුත්වැඩියා කර සේවය සඳහා යොදා නොගෙන අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා කුලී රථයකට දිනකට රු.8,000 බැගින් කුලි රථ 02 ක් සඳහා (2015 ඔක්තෝම්බර් 31 දින සිට **2015** දෙසැම්බර් **31** දක්වා) රු.928,000 ක මුදලක් ගෙවා තිබුණි.

ඇ) නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) 159 (1) වගන්තියේ විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී නගර සභාවේ සභාපති **,**උපසභාපති හා සභා ලේකම්ගේ පෞද්ගලික පරිහරණය සඳහා වූ රූපවාහිනි සම්බන්ධතා (**PEO TV**) ගාස්තු වෙනුවෙන් රු.23,428 ක බිල්පත් සභා අරමුදලින් දරා තිබුණි.

ඈ) 2015 දෙසැම්බර් 31 වැනි දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය වූ රු. 4,409,650 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි **371 (5)** ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

ඉ) සභාවේ වසර 08 කට පෙර සිට පැවත එන රු.9,625,340 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුද්ල රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

ඊ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 762 ප්‍රකාරව ගබඩාවේ අවශ්‍ය භාණ්ඩ වල පමණක් තොග තබා ගැනීමත් පමණට වඩා අධික තොග තබා නොගැනිමත් ගබඩා නිලධාරියාගේ රාජකාරිය විය යුතු වුවත් සභාව විසින් මිලදී ගෙන තිබූ එකතුව රු.628,692 ක් වූ අයිතම 63 කට අදාළ ගබඩා ද්‍රව්‍ය තොගයක් නිකුත් කිරිමකින් තොරව ගබඩා ගත කර තිබුණි. භාණ්ඩ රැස්කර තිබූ කාලය මාස 06 සිට මාස 27 ක කාල පරාසයක් විය.

උ) 2015 අප්‍රේල් 11 දිනැති ප්‍රධාන ලේකම් (පළාත් මුදල් අමාත්‍යාංශය) හා පළාත් භාණ්ඩාගාර ලේකම්ගේ අංක 6/2015 දරණ මුල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව නගර සභාවේ ලේකම්ගේ නිවාස හා ජංගම දූරකථන ගාස්තුව උපරිමය රු.2,500 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එම සීමාව ඉක්මවා මාස 06 ක් සඳහා රු.6,659 ක මුදලක් සභා අරමුදලෙන් දරා තිබුණි.

4.2 සේවක ණය

2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂවල එකතුව රු. 33,786,452 ක් වූ අතර ඉන් ස්ථාන මාරු වී ගිය හා විශ්‍රාම ගිය අයගේ හිඟ ණය ශේෂ රු.2,970,941 ක් විය. එය සමස්ථ අයවිය යුතු හිඟ ශේෂයෙන් සියයට 8 ක් වූ අතර හිඟ ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක්ද ඉදිරිපත් කර නොතිබුණි.

4.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

---------------------------------

2014 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ නගර සභාව එක්ව ක්‍රියාත්මක කල ආර්ථික සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් සභාවේ පරිපාලන වියදම් පියවා ගැනීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලබා දුන් රු.100,000 ක මුදල උක්ත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී සහා අරමුදලින් දරන ලද (ලිපිද්‍රව්‍ය වියදම්, දුරකථන වියදම්,ඉන්ධන වියදම්) වියදම් පියවා ගැනීමට යම් ප්‍රතිෂ්ඨාවක් සහා අරමුදලට බැර නොකර ඉහත කී රු.100,000 ක මුදල යම් නෛතික පදනමකින් හා අනුමැතියකින් තොරව ලේකම් සහ සභාපති ඇතුලු නිලධාරීන් 18 දෙනෙකු අතරේ බෙදා ගෙන තිබුණි.

4.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

4.4.1 පිළිසරු ව්‍යාපෘති යටතේ ආරම්භ කර ඇති පොතුවිල් කුඹුර කොම්පොස්ට් අංගණය

--------------------------------------------------------------------------------

මධ්‍යම පරිසරි අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය එක්ව කොලොන්නාව නගර සභාවේ කසල කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් අක්කර 04 ක භූමියක් පවරා දිමෙන් හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් කොම්පොස්ට් අංගනයක් ඉදිකිරීමටත්, නගර සභාව විසින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර පවත්වාගෙන යාමටත් 2009 මැයි 06 දින ගිවිසුමකට එළඹී තිබුණි. 2012 වර්ෂයේ සිට 2014 මැයි මාසය දක්වා යථෝක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මකව තිබු අතර මේ කාලය තුලදී කොම්පොස්ට් පොහොර අලෙවියෙන් රු.162,462 ක ආදායමක් උපයා ගෙන තිබුණි. 2014 මැයි මාසයේදී කොම්පොස්ට් අංගනය මතට කුණු කන්ද කඩා වැටීම නිසා එහි ක්‍රියාකාරිත්වය සම්පූර්ණයෙන් නතර වී තිබු අතර එම ව්‍යාපෘතිය යලි ක්‍රියාත්මක කර පවත්වා ගෙන යාමට සභාව නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4.4.2 පාරිසරික ගැටළු

------------------

කොලොන්නාව නගර සීමාවේ ඇති මීතොටමුල්ල කසල අංගනයට කොළඹ මහා නගර සභාව, සහ කොලොන්නාව නගර සභාව මගින් අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් දැඩි පාරිසරික ගැටළු මෙන්ම සෞඛ්‍ය ගැටළු මතුව ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. පාරිසරික දූර්ගන්දය පැතිර තිබූ අතර ප්‍රදේශයේ ළිං ජලය අපවිත්‍ර වි තිබුණි. අවට නිවාසවල වෙසෙන ප්‍රජාව ස්වසන රෝග චර්ම රෝගවලට ගොදුරු වී තිබූ අතර ජලය අපවිත්‍ර වීම මත උදරාබාද රෝග වලට ලක්වූ රෝගීන් සිටින බව ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්ගේ වාර්තා වලින් අනාවරණය විය. මේ අනුව දිනෙන් දින ගොඩ නැගෙන කුණු කන්ද හේතුවෙන් අවට නිවාස වල වෙසෙන ප්‍රජාවගේ මානසික, පාරිසරික, සාමාජීය, හා ආර්ථික ගැටළු උග්‍ර ලෙස බලපා තිබෙන බව නිරීක්ෂණය විය.

4.5 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

2015 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරන ලද ඇස්තමේන්තු වටිනාකම රු.29,413,215 ක් වු කර්මාන්ත 75 ක වැඩ ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

5 ගුණාත්මකභාවය හා යහපාලනය

----------------------------------

5.1 අභ්‍යන්තර විගණනය

------------------------

අභ්‍යන්තර විගණන අංශය ක්‍රියාත්මක වුවද, 2015 වර්ෂයේ අභ්‍යන්තර විගණන වැඩ සටහන විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණු අතර අභ්‍යන්තර විගණනයක්ද සිදුකර නොතිබුණි.

5.2 වත්කම් කළමනාකරණය
----------------------------
නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්
-----------------------------------------

5.2.1 එකතු වටිනාකම රු.1,011,875 ක් වූ අබලි වාහන 05 ක් සහ ක්‍රියාවිරහිත තත්වයේ පැවති වටිනාකම රු.3,406,365 ක් වූ කම්පැක්ටරය වෙන්දේසිකර ඉවත් කිරීමට හෝ අලුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කල යුතු වුවද එම වාහන නගරසභා භූමියේ දිරාපත් වෙමින් පැවතින.

5.2.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය
------------------------------
සමාලෝචිත වර්ෂයේදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

6 පද්ධති හා පාලන
---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණනය
(ආ) ගිණුම්කරණය
(ඇ) මූල්‍ය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) කොන්ත්‍රාත් පාලනය
(ඊ) තොග පාලනය